# නූතන ග්‍රාමීය සමාජ සංවර්ධනය හමුවේ විනාශයට ලක්වන සෙවනගල බෞද්ධ උරුමය පිළිබඳ අධ්‍යයනයක්

## (මහගම මහානාග රාජමහා විහාරය ඇසුරෙන්)

කසුන් කුමාර පතිරණ

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් මහවැලි ගඟෙන් හා කළු ගඟෙන් සීමාවන පරිදි රෝහණ රාජ්‍යය රජරට රාජධානි සමයේ සිටම පැවත ආ බව පැරණි වංශකතා සක්ෂි දරයි. රජරටම සතුරු ආක්‍රමණයන් එල්ල වු සෑම අවස්ථාක පාහේ එහි රාජ පාලකයන් ආරක්ෂා කර ගැනිමට හා බුදුදහම සුරැකිම සඳහා රෝහණය මුළිකත්වය ගනු ලැබීය. ක්‍රි.පු තුන්වන ශතවර්ෂයේ දී ලක්දිවට බුදුදහම පැමිණිමෙන් පසු එහි ආභාෂය නොඅඩුව රෝහණයට ද ලැබි ඇත. රජරට රාජධානියට සමගාමීව රෝහණයේද මහා පරිමාණ බෞද්ධ වෙහෙර විහාර ගොඩනැතුන අතර යටාලවෙහෙර, තිස්සමහාවෙහෙර, පබළු වෙහෙර, තිස්සමහාරාම කිරිවෙහෙර එසේ මාගම රාජධානියට කේන්ද්‍රකර ගනිමින් බිහිවු විහාරයන්ගේ සමහරකී.

රෝහණයේ අගනුවරින් ප්‍රත්‍යන්තව පිහිටි බෞද්ධ ග්‍රාමීය ජනපදිකයින් වාසය කළ පෙදෙසක් ලෙස සෙවනගල ප්‍රදේශය හඳුනාගත හැකිය. ඒකී ජනපදවල ස්වභාවය හඳුනා ගැනිමට මෙම ප්‍රදේශයෙන් හමුවන පුරාවිද්‍යාත්මක සාක්ෂිම ප්‍රමාණවත් වන්නේය. පැරණි ඌරුසිටා වැව සමීපයේ පිහිටි මහානාග රාජමහා විහාරය එයට කදිම නිදසුනකි. මෙම පැරණි විහාරයට කෙන්ද්‍ර කරගත් ජනපද ඌරුසිටා වැවේ ජලයෙන් පෝෂණය වු අතර ජනපදිකයින්ගේ අධ්‍යාත්මය පෝෂණය කිරිමට මහානාග රාජමහා විහාරය දායක වන්නට ඇති බව මෙම පරිශ්‍රයෙන් හමුවන ද්‍රව්‍යාත්මක සාක්ෂි ප්‍රමාණවත් තරම් සාක්ෂි දරන්නේය. පැරණි විහාර සංකිර්ණයක් ලෙසින් පැවත ඇති මෙම භූමියෙහි නූතනයේදී දැකගත හැකිවන්නේ ස්තූප ගොඩැල්ලක්, ගල් කණු විසිරුණු ජනාවාස ගොඩැලි කිහිපයක්, බුදු පිළිම කොටසක්, බෝධිසත්ව පිළිම කොටසක් සහ තැන තැන විසිරුණු පුරාවිද්‍යාත්මක අවශේෂ සමුහයක් පමණි. පුරාවස්තු මංකොල්ල කරුවන්ගේ ග්‍රවහණයට නතුවිම හේතුවෙන් සහ කාලයක් පුරාවට ජනශූන්‍ය වීමෙන් මෙන්ම විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් මෙම පරිශ්‍රය නූතනයේ ද දැඩි අවධානම් සහගත තත්ත්වයකට පත්ව ඇත. ඓතිහාසික රෝහණ රාජ්‍යයට අයත් පුරාවිද්‍යාත්මක වටිනාකම හා බෞද්ධ උරුමයක් ලෙසින් පවතින වැදගත්කම විවරණය කිරිම සඳහා මෙන්ම නූතනයේ දී එල්ල වී ඇති මානව බලපෑමේ තීව්‍රතාවය විමසිමේ අරමුණින් මෙම පර්යේෂණය 2016 වසරේ දී සිදු කරනු ලැබීය.

## අධ්‍යයන ගැටලුව

අනුරාධපුර යුගයේ මුල් අවධියේ දී නිර්මාණය කරන ලද මහානාග රජ මහාවිහාරයේ පුරාවිද්‍යාත්මක වැදගත්කම විමර්ශණය කිරීමේ දී පහත සඳහන් ප්‍රධාන අධ්‍යයන ගැටළුව මතුවේ.

"නූතන සමාජ සංවර්ධනය හමුවේ බෞද්ධ උරුමයන් අභියෝගයට ලක්වන්නේ කෙසේද?"

මෙම ගැටලුව විසදා ගැනිම සඳහා අධ්‍යයන ප්‍රශ්ණ කිහිපයක් නිර්මාණය කරගත් අතර ඒ තුළින් ප්‍රධාන අධ්‍යයන ගැටළුව නිරාකරණය කරගෙන මහානාග රජමහා විහාරයෙහි බෞද්ධ උරුමයට එල්ල වී ඇති අභියෝග හඳුනා ගත හැකි විය. මහානාග රජමහා විහාරය කවුරුන් විසින් නිර්මාණය කරන ලද්දක් ද?. අතීතයේ දී මෙම ප්‍රදේශය ජන ශූන්‍ය වුයේ ඇයි?. මහානාග රජමහා විහාර පරිශ්‍රයෙහි ඇති පුරාවිද්‍යාත්මක වැදගත්කම කවරේද?. මානව ක්‍රියාකාරකම් නිසා ක්ෂේත්‍රයට එල්ල වී ඇති බලපෑම කවරාකාර ද? යන අධ්‍යයන ගැටලු මෙහිදී විමර්ශනයට බඳුන් විය.

## අධ්‍යයන ක්‍රමවේදය

පැරණි රෝහණ දේශයට අයත් මහගම මහානාග රජ මහා විහාර පරිශ්‍රයෙහි බෞද්ධ උරුමයට එල්ල වී ඇති මානව බලපෑම පිළිබඳව විමර්ශනය කිරීමේ දී ප්‍රධාන වශයෙන් අධ්‍යයන ක්‍රමවේදය ලෙසින් භාවිතයට ගනු ලැබුයේ ක්ෂේත්‍ර ගවේශනයයි. මෙහිදී ක්ෂේත්‍රය සකස් වීමේ ක්‍රියාවලිය මානව ක්‍රියාකාරකම් නිසා සිදුව ඇති බලපෑමේ තිව්‍ර භාවය හාක්ෂේත්‍රයේ සම්පත් සක්‍යතාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබීය.

## අධ්‍යයන අරමුණු හා වැදගත්කම

මහානාග රජමහා විහාරය ආශ්‍රිතව සිදු කළ ක්ෂේත්‍ර අධ්‍යයනයේ අරමුණු කිහපයක් විය. එහිදී මෙම පරිශ්‍රයෙහි පවතින පුරාවිද්‍යාත්මක අගය හඳුනා ගැනීම ප්‍රධාන අරමුණ වු අතර මහානාග රජමහා විහාරය හා බැදි ප්‍රදේශයෙහි පැරණි මානව ජනාවාස ස්වභාවය හඳුනා ගැනිම තවත් අරමුණකි. තවද පැරණි බෞද්ධ ග්‍රාම සංකල්පය කොතරම් දුරට මෙම ප්‍රදේශයට අදාළ කර ගත හැකිද යන්න විමර්ශනය කිරිමද මෙම පර්යේෂණයේ අරමුණකි.

රෝහණ රාජ්‍යයේ අගනුවරින් ප්‍රත්‍යයන්ත ජනපදවල ස්වභාවය හඳුනාගත හැකිවීම. බෞද්ධ උරුමයන් ග්‍රාමීය ප්‍රදේශයන්හි ව්‍යාප්ත වු අන්දම හඳුනා ගැනිමට මෙන්ම නූතනයේ දී එම උරුමයන්ට එල්ල වී ඇති බලපෑම් හා තර්ජන හඳුනා ගැනිම සඳහා මෙම පර්යේෂණය වැදගත් වේ.

අතීතයේ දී මහා විහාර සංකීර්ණයක් ලෙසින් පැවත ඇති මෙම භූමියෙහි පුරාවිද්‍යාත්මක උරුම රාශියක් දැක ගත හැකිය. ඒවා පහත පරිදි පෙළ ගැස්විය හැකිය.

මහානාග විහාරයෙහි දක ගත හැකි බෞද්ධ උරුමයන් අතර ප්‍රධාන තැනක් ස්තූප ගොඩැල්ල ලබා ගනී. වර්ග මීටර් 100 කට වඩා වැඩි ප්‍රදේශයක් පුරා විසිර ඇති මෙම ස්තූප ගොඩැල්ල මත නූතනයේදී ශාක වර්ධනය වීමෙන් එය තව තවත් විනාශ වෙමින් පවතී. මෙම ස්තූපයට අයත් යැයි විශ්වාස කළ හැකි ගඩොල්, යන්ත්‍ර ගල, යූපගල හා ඡත්‍රය ස්තූපය අසලම දකගත හැකිය. එසේම ස්තූපය වටා ගල් පතුරු රාශියක් විසිරී පැවතීම මගින් මෙම ස්තූපයෙහි සලපතල මලුවක් පවා තිබී ඇති බව උපකල්පනය කළ හැකිය. ස්තූපය මධ්‍යයේ ඉහළ සිට පාදම දක්වා පුරාවස්තු මංකොල්ල කරුවන් විසින් කණින ලැබූ වළක් නූතනයේදී දකගත හැකිය. ඍජු ලෙසම මෙම ස්තූපය පුරාවස්තු මංකොල්ල කරුවන්ගේ ග්‍රහනයට නතුව විනාශ වී ඇති සේම නිසි පුරාවිද්‍යා අවධානයකට ලක් නොවීම නිසා තවතවත් විනාශ වෙමින් පවතී.

මෙම පරශ්‍රය අධ්‍යයනය කිරිමෙන් නටබුන් වූ ගොඩනැගිලි පැවති ස්ථානයන් ත්‍රිත්වයක් හඳුනාගත හැකි විය. මෙම ස්ථානයන්හි ගල් කණු කොටස් හා පැරණි ගඩොල් හා උළු කැබලි විසිරී පවතී. නූතනයේ දී විවිධ අවශ්‍යතා සඳහා මෙම ස්ථානයන්හි ගල් කණු කොටස් කඩාගෙන ඉවත් කරගෙන ගොස් ඇති බවද ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් පැහැදිලි විය. පැරණි සංඝාවාස, ප්‍රතිමාගෘහ සහ වෙනත් ආරම්භක ගොඩනැගිලි මෙම ස්ථානයන්හි පවතින්නට ඇතිබව හමුවන ද්‍රව්‍යාත්මක සාක්ෂි මගින් තහවුරු කරගත හැකිය.

ක්‍රි.ව 07 සිට ක්‍රි.ව 10 සියවස අතර කාලයේ දී මහායානික බලපෑමත් සමඟ බෝධිසත්ව වන්දනය ජනප්‍රිය වූ අතර ග්‍රාමීය ප්‍රදේශයන්ට ද එහි ආභාෂය සිදු වූ බව මෙම විහාරයෙන් හමුවන බෝධිසත්ව ප්‍රතිමා කොටස සාක්ෂි දරයි. නිදන් හොරුන් විසින් මෙම ප්‍රතිමාවේ ශිර්ෂය සමඟ උඩුකය කොටස සෙන්ටිමීටර් 153 පමණ වේ. මෙහි ජෝතියකින් සැරසී සිටින ආකාරයට නිමවා ඇති අතර එතරම් ආභරණ භාවිත කර නැති බව පෙනේ. උඩුකය හමු නොවන නිසා නිසි පරිදි මෙය කිනම් කාලපරිච්ඡේදයකට අයත් බෝධිසත්ව පිළිමයක් දැයි අනාවරණය කිරිම දුෂ්කරය.

බෝධිසත්ව ප්‍රතිමාවේ මෙම පරිශ්‍රයෙන් හමුවන බුදු පිළිමයෙහි ද සිරස සමඟ උඩුකය නිදන් හොරුන් විසින් කඩාගෙන ගොස් ඇත. නූතනයේ දී හමුවන කොටසෙහි උස සෙන්ටිමීටර් 135 ක් පමණ වේ. පුරා වස්තු මංකොල්ල කරුවන් දැඩි බෞද්ධ උරුමයක් වූ බුදු පිළිමයන් විනාශකර දමා තිබීම ශෝචනීය වේ.

මෙම පරිශ්‍රය ආශ්‍රිතව අවශේෂ පුරාවිද්‍යා ද්‍රව්‍ය රැසක් හමු වේ. ඒ අතර යන්ත්‍රගලක්, යූපගලක්, ඡත්‍ර ගලක්, ප්‍රතිමා ආසන හා සඳකඩපහන සුවිශේෂි වේ. මේවා ශෛලමය ඒවා වන අතර නූතනය වනවිට මානව ක්‍රියාකාරකම්වල බලපෑමෙන් විනාශ වෙමින් පවතී. එසේම අනුරාධපුර මුල් සමයට අයත් උළු කැබලි, ගඩොල් කැබලි හා වලං කැබලි රැසක් විහාරය ආශ්‍රිතව හමුවේ. මෙම විහාරයේ අතීතයේ පැවති සශ්‍රිකත්වය දක්වීමට මේවා කදිම නිදසුනකි.

## නිගමනය

මහානාග විහාර පරිශ්‍රයෙන් හමු වූ පුරාවස්තු අතරින් සඳකඩ උළු හා ගඩොල් අවශේෂයන්ට අනුව මෙම විහාරය අනුරාධපුර මුල් සමයට අයත්වන බව නිගමනය කළ හැකිය. එසේම මෙම විහාරය ක්‍රි.ව 07-11 කාලය වන තෙක්ම සක්‍රිකව පැවති බව බෝධිසත්ව ප්‍රතිමා කොටසින් නිගමනය කල හැකිය. තවද මෙම ප්‍රදේශයට මහායානික බලපෑමද එල්ල වී ඇත.

මහගම මහානාග රජමහා විහාර පරිශ්‍රය නූතනයේ දී දැඩි ලෙස විනාශ වී ඇති අන්දම ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් අනාවරණය කරගත හැකි කරුණකි. මෙහි පවතින බෞද්ධ උරුමයන් අතරින් වැදගත් ස්තූපය පුරාවස්තු මංකොල්ලකරුවන් හාරාදමා ඇත. එසේම බෝධිසත්ව හා බුද්ධ ප්‍රතිමාවට සිදු කර ඇති හානිය අති විශාලය. අතීතයේ විශාල ප්‍රදේශයක් පුරා කීර්තිමත්ව මෙම විහාරය පවතින්නට ඇතිබව නටබුන් හාත්පස ප්‍රදේශය පුරාවටම හමු විය. ඒ අනුව මෙය ඉතිහාසයෙහි එක් සමයක කීර්තිමත් විහාර සංකීර්ණයක්ව පවතින්නට ඇත.

මෑත කාලීන මානව බලපෑමේ තිව්‍ර භාවය නිසාම මෙම විහාරයෙහි ඓතිහාසික බෞද්ධ උරුමය අදවන විට වීනාශ වෙමින් පවතී. එයට ඍජු ලෙසම පුරාවස්තු මංකොල්ල කරුවන්ගේ බලපෑම හේතු වී ඇත. එම නිසා පුරාවිදුවන්ගේ අවධානය මෙම පරිශ්‍රය කෙරෙහි යොමු වී කඩිනමින් මෙම පරිශ්‍ර විනාශයෙන් මුදවාගෙන රැක ගැනීම අත්‍යවශ්‍ය වේ.

ප්‍රමුඛ පදඃ සෙවනගල, බෞද්ධ උරුමය, සමාජ සංවර්ධනය

## ආශ්‍රිත ග්‍රන්ථ

*දීපවංශය.* (1970). (සංස්.). ඥාණවිමල හිමි,කිරි ඇල්ලෙ. කොළඹ

*මහාවංශය.* (1959).(සංස්.). බුද්ධදත්ත හිමි. පොල්වත්තෙ කොළඹඃ ඇම්.ඩී ගුණසේන සමාගම.

ඇඳගම, පණ්ඩුල. (1985). *සිංහ සමාජ මහවැලි වංශය.* මහවැලි සංවර්ධන අමාත්‍යංශයේ ඉන්ජිනේරුමය කාර්යන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය.

පියසේන,කහඳ ගමගෙ.(2004).*බින්තැන්නේ විත්තිල*.සරසවිප්‍රකාශකයෝ.

පියසේන, කහඳගමගෙ.(1996).*මා දුටු බින්තැන්න*.සමාජ සංස්කෘතික අධ්‍යයනයක්, කොට්ටාවලඃ සාර ප්‍රකශන.